දිනන දකුණ මාධ්‍ය හමුව

2026 පෙබරවාරි 11

දිනන දකුණ විධායක සභික හා මාධ්‍ය ප්‍රකාශක තුෂාර වීරරත්න මහතා.

මේ මොහොතේ විශේෂයෙන්ම ත්‍රිකුණාමලයේ ඇතිවී තිබෙන සිද්ධිය පිළිබඳව අපි දන්නවා. මේ වෙනකොට රට තුළ අපි අපේක්ෂා නොකරන තත්ත්වයක් මතුවෙමින් තියෙනවා. විශේෂයෙන්ම ඊයේ දවසේ කෝට්ටේ කල්‍යාණිය ශ්‍රී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ මහා නායක අතිපූජ්‍ය ඉත්තෑපානේ ධම්මාලංකාර මහා නායක ස්වාමීන් වහන්සේ අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා වෙත ලිපියක් යොමු කරමින් ත්‍රිකුණාමලයේ සිද්ධිය සම්බන්ධයෙන් විශේෂයෙන්ම මහා සංඝරත්නය මැදිහත්වීම පිළිබඳව කරුණු පැහැදිලි කරලා තියෙනවා. අපි මෙතනදි විශේෂයෙන්ම රජයට කියනවා මේ ප්‍රශ්නය අනවශ්‍ය තැනකට යාම වළක්වා ගැනීම ක්‍රියාකරන ලෙස. හේතුව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව පොලිසිය සහ විශේෂයෙන්ම ස්වාමීන් වහන්සේලාත්, ඒ අදාළ පාර්ශවයෙනුත් අතර යම්කිසි ඇතිවෙච්ච මතභේදකාරී තත්ත්වයක් මේ වෙනකොට අනවශ්‍ය තත්ත්වයක් දක්වා වර්ධනය වෙලා තියෙනවා. මේකේ කෙළවර අවසානයේ ආගමික ප්‍රචණ්ඩත්වයක් එහෙම නැත්නම් අන්තවාදය දක්වා යාම වලක්වා ගැනීම රජය වගකීම. එතනදි අධිකරණමය ක්‍රියාවලිය පිළිබඳව අපි කිසිසේත්ම මෙය අවස්ථාවේදී අදහස් දැක්විය යුතු නැහැ. නමුත් ඒ අධිකරණමය ක්‍රියාවලිය පිළිබඳව ජනමාධ්‍ය හරහා සමාජ මාධ්‍ය හරහා වාර්තාවන තොරතුරු මත රට පුරාම මේ පිළිබඳව සංවාදයක් ඇතිවෙලා තියෙනවා. විශේෂයෙන්ම අත්අඩංගුවට පත්ව සිටින ස්වාමීන් වහන්සේලා සහ ඒ සිද්ධියට සම්බන්ධ පාර්ශවයන් අධිකරණයට ඉදිරිපත් කරලා ඇප ලබා ගැනීම සම්බන්ධ ප්‍රශ්නයේ දී, යම්කිසි ආකාරයකට පොලිසිය ක්‍රියා කරපු ආකාරය පිළිබඳව සමාජයේ විශාල ආන්දෝලනයක් ඇතිවුණා. විශේෂයෙන්ම අධිකර හමුවේ පොලිසිය ප්‍රකාශ කළා යැයි මාධ්‍ය වාර්තා කළා, අදාළ අත්අඩංගුවට පත්ව සිටින පාර්ශවයන් ගොනුකර තිබෙන මූලික අයිතිවාසිකම් නඩුව ඉවත් කර ගන්නේ නම්, පොලිසිය මේ සම්බන්ධයෙන් සලකා බැලීමක් වගේ සිදුකිරීමක් කරන බවට අධිකරණයේ ප්‍රකාශ වුණා කියලා. අපේ අදහස තමයි නමුත් මේ ප්‍රශ්නය අනවශ්‍ය ආගමික ගැටුමක් හෝ වෙනත් ජාතිවාදී ගැටුමක් දක්වා ගෙන යන්න, ඒ මත දේශපාලනය කරන සහ ඒ මත විවිධ ක්‍රියාකාරකම් කරන කණ්ඩායම් වලට ඒ තත්ත්වය ඇති කරන්න ඉඩදීම රජයේ දුර්වලතාවයක්. රජය මේ ප්‍රශ්නයේදී මැදිහත් විය යුතු වෙනවා. එසේ නොවුනොත් අනවශ්‍ය තැනකට මේක යාම හරහා රට තුළ බලාපොරොත්තු නොවන මීට පෙර ඇතිවෙච්ච තත්ත්වයන් දක්වා වර්ධනය වෙන්න ඉඩ දුන්නොත් ඒක සම්පූර්ණයෙන් වගකීම රජය බාරගත යුතු වෙනවා. මේ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා අදාළ අංශ ඕනෑ තරම් තියෙනවා. සාසනාරක්ෂක බල මණ්ඩලය මහනායක ස්වාමීන් වහන්සේලා ඒ වගේ මේ සිද්ධියට අදාළ වෙන දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතන මේ සාධාරණ විසඳුමකින් අවසන් කර නොගත්තොත් මේ හරහා විශේෂයෙන්ම ඉතිහාසයේ ජාතිය ආගම පදනම් කරගෙන යම් යම් ගැටුම් නිර්මාණය කරමින් දේශපාලනය කරන කණ්ඩායම් වලට යම්කිසි අවස්ථාවක් ලැබෙනවා, මේ තුළ කටයුතු කරන්නේ. ඒ නිසා ඒ පිළිබඳව රජයේ විශේෂ අවධානය යොමු විය යුතුයි. අපි විශ්වාස කරනවා මේක අනවශ්‍ය තැනකට යොමු වීම වළක්වා ගැනීම රජයටවත්, ඒකට විපක්ෂයට හෝ වෙනත් කණ්ඩායමකට ඒ කාරණය එල්ල කරලා චෝදනා කිරීමෙන් පළක් වෙන්නේ නැහැ. ඒ නිසා වගකිවයුතු රජයක් විදිහට විශේෂයෙන්ම දැන් ජනාධිපතිවරයාගේ වගකීමක් වෙනවා මැදිහත්වීම මහානායක ස්වාමීන් වහන්සේ නමක් ජනාධිපතිවරයාට යොමු කරපු ලිපියක් තියෙනවා. ඒ තුළ පදනම් වෙච්ච කරුණු තියෙනවා. ඒ වගේම දේශපාලන නායකයින් ගණනාවක් මේ පිළිබඳව අදහස් දක්වලා තියෙනවා. මහා සංඝරත්නයට අදහස් දක්වලා අන්තයකට තල්ලු වීම වළක්වා ගැනීම රජයේ වගකීම. ඒ

වගේම තව එක කාරණයක් පිළිබඳව මම මේ මාධ්‍ය හමුවේදී අවධානය යොමු කරනවා. මේ වන විට රට තුළින් යම් මට්ටමකින් වැඩ වර්ජන උද්ඝෝෂණ සහ විරෝධතා රැල්ලක් නිර්මාණය වෙමින් තියෙනවා. හැබැයි ඒ වැඩ වර්ජන උද්ඝෝෂණ විරෝධතා රැල්ල නිර්මාණය වීමට රජයත් පැහැදිලිවම වගකිව යුතු වෙනවා.

දිනන දකුණ විධායක සභික හර්ෂ ගුණසේන මහතා.

ආණ්ඩුව දැන් කියනවා ඉතිරෙන්න සල්ලි කියලා. සල්ලි ඉතිරෙන්න තියෙන්නේ පසුගිය ආණ්ඩුවේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ දේශපාලන නායකත්වයෙන් යුක්ත ආණ්ඩුව අයිඑම්එෆ් ජාත්‍යන්තර මූල්‍ය අර මුදලත් එක්ක එකඟ වෙච්ච නිර්ණායක ඒ ආකාරයෙන් ඒ ආණ්ඩුවත් ක්‍රියාත්මක කරා. ඒ නිර්ණායක ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ ගැන ඒ නිර්ණායක ක්‍රියාත්මක කිරීම ගැන අපි සන්තෝෂය නම් මොකද මේ ආණ්ඩුව බලයට පත්වෙන්න. ඉස්සෙල්ලා මේවා වෙනස් කරනවා කියන වගේ අදහසක් ඉදිරිපත් කළා. ඒක කරන්නේ නැතුව ඒ දේ ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරගෙන යන එක ගැන අපි සෑහීමකට පත්වෙනවා. දැන් මේ නිර්ණායක අතර තියෙනවා දළ දේශීය නිෂ්පාදිතය ප්‍රතිශතයක් වශයෙන් ප්‍රාථමික ගිණුමේ ශේෂය දළ දේශීය නිෂ්පාදිතය ගිණුමේ ප්‍රතිශතයක් වශයෙන් ආණ්ඩුවේ ආදායම යනාදී වශයෙන් ඒ සියල්ලම ඉතාම හොඳ තත්ත්වයේ තියෙනවා. ඒක ඉතාම සුභදායි දෙයක්. නමුත් මේ තත්ත්වය පිළිබඳ සෑහීමකට පත්වෙන්නට පුළුවන්ද? ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මේ අවධානය යොමු කරන්නේ රාජ්‍ය මූල්‍ය ස්ථායිතාවය පිළිබඳව. රටක් ගොඩනැගීමට නම් රාජ්‍ය මූල්‍ය ස්ථායිතාවයෙන් එහාට ගිහිල්ලා රටේ ආර්ථික වෘද්ධිය වර්ධනය වෙනුවෙන් තියෙනවා. දැන් අනිත් කාරණය තමයි දැන් පහුගිය කාලේ මේ 2022 කාලේ බරපතල උද්ධමනයක් රටේ තිබුණා. සියයට හැත්තෑවක පමණ ප්‍රමාණයකට උද්ධමනය ගියා. එතකොට ඒ තත්ත්වය ඒ තත්ත්වය යටතේ ජනතාවගේ ජීවන වියදම වැඩි වුණා. එතකොට ඊට පස්සේ පාලනය කරලා තියෙනවා. දැන් ඒ තත්ත්වයට තාම ඇවිල්ලා නෑ. අවධානයෙන් කෙලින්ම ටිකෙන් ටික උඩට යමින් තියෙනවා. එතකොට මේ උද්ධමනය අඩුවීම කියන්නේ මේ මිල මේ වැඩිවීමේ වැඩිවීමක් අඩු මිල වැඩිවීම අඩු වීමක්. හැබැයි ඒ වැඩි වෙච්ච මිල තාම ඒ ආකාරයටම තියෙනවා. යම්කිසි වෙනස්කම්වලට යටත්. එතකොට මේ වෙච්ච මිල නිසා ජනතාවගේ ජීවන තත්ත්වයට වෙච්ච මේ බලපෑම කොහොමද කියල අපිට සාමාන්‍ය ජීවිතයේදීම බලාගන්නට පුළුවන්. නමුත් ජන ලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මේ අවුරුදු පහකට සැරයක් විතර කුටුම්බල ආදායම සහ වියදම පිළිබඳව ගණනය කිරීමක් කරනවා. ඔවුන් ඒ මේ සංගණනය කරලා තියෙනවා. නමුත් ඒකෙ ප්‍රතිඵල එන්න බොහෝ දුරට මේ අවුරුද්ද අවසන් වෙයි. එතකොට මේ ඒ කාලේ ජන ජීවිතයට වෙච්ච බලපෑම බලාගන්න වෙන්නේ නිශ්චිතව බලාගන්න වෙන්නේ ඒ ප්‍රතිඵල ආවට පස්සේ. හැබැයි දැන් මේ ජන ජීවිතය නංවන්න රටේ ආර්ථික වෘද්ධිය ඇති කරන්න කරන්න පුළුවන් එක දෙයක් තමයි අපේ අපනයන සංවර්ධනය කරන. ඒක දැන් රනිල් වික්‍රමසිංහ මහත්මයා ජනාධිපති වෙලා ඉන්න යුගයේ සම්මත කරා පනතක් 2024 අංක 45 දරණ ආර්ථික පරිවර්තන පනත. ඒ ආර්ථික පරිවර්තන පනත උඩ යෝජනා කරලා තිබුණා ශ්‍රී ලංකා ආර්ථික උපදේශක සභාව, ශ්‍රී ලංකා ආයෝජන කලාප ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ කාර්යාලය, ජාතික ඵලදායිතා කාර්යාලය. එතකොට මේ පනත ක්‍රියාත්මක කිරීම මේ ආණ්ඩුව පස්සට දාලා තියෙනවා. ඒකට සංශෝධන කියන අය කියලා තියෙන අපි දන්නෑ මොනවගේ සංශෝධනය අරන් එන්නේ කියලා. එතකොට මේ පනතේ අනිත් කාරණය තමයි මේ යම් යම් නිර්ණායක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක එකඟ වෙච්ච නිර්ණායක මේ පනතට අරගෙන ඇවිල්ලා තියෙනවා. හැබැයි එතනින් එහාට ගිහිල්ලා රටේ ආර්ථික වෘද්ධය සඳහා උපකාරී වන

විශේෂයෙන්ම අපනයන සම්බන්ධයෙන් යම් යම් නිර්ණායක මේ යම් යම් ටාගට් හඳුන්වලා දීලා තියෙනවා. උදාහරණයක් වශයෙන් 2025 වෙනකොට අපනයන, 2025 වෙනකොට ශ්‍රී ලංකාවේ අපනයන දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 25%ක්. 2030 වෙනකොට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට හතළිහක්. 2040 වෙනකොට සීයට හැටක් යනාදී වශයෙන් ඉහළ නැංවීමට මේ පනතේ මේ නිර්ණායක දාලා තියෙනවා. දැන් එතකොට දැන් ආණ්ඩුව මේවා කරන්නේ නැත්නම් හැබැයි මේක තමයි යන්න තියෙන මාර්ගය. අනුව ආණ්ඩුව ඇවිල්ලා කියන්න ඕනා. අපි මොනවාද කරන්න බලාපොරොත්තු වෙන්නේ කියලා.

දිනන දකුණ විධායක සභික සාලිය ගුණරත්න මහතා

මම ඇත්තටම කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන්. කාරණා කීපයක් දැන් වාර්තා වෙන විදිහට සංචාරකයන්ගේ ලංකාවට පැමිණීමේ ප්‍රමාණය වැඩිවෙලා තියෙනවා. නමුත් ඊට සාපේක්ෂව ඒක පුද්ගල සංචාරකයෙක්ගේ ලංකාව ඇතුලේ වියදම් කරන මුදල අඩුවෙලා තියෙනවා. ඉතින් එතකොට ඒකෙන් ලංකාවට ලැබෙන විදේශ විනිමය ප්‍රමාණය වැඩිවෙලා තිබුනට ගොඩක් වෙලාවට ලංකාවේ ඒක සංචාරක ව්‍යාපාරයේ තියෙන ගුණාත්මක බව ඒ හරහා අඩුවෙලා තියෙනවා. ඒකෙ ප්‍රතිඵලයක් විදිහට ගොඩක් වෙලාවට පසුගිය කාලයේදී අවුරුදු කීපයකට කලින් ගත්තොත් එහෙම සමහර වෙලාවට යුරෝපයේ සිට පැමිණෙන ධනවත් සංචාරක ව්‍යාපාරකයන් ගොඩක් වෙලාවට ලංකාවෙන් බලාපොරොත්තු වෙන්නේ ගුණාත්මක සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ දේවල් සහ පහසුකම් යුරෝපයේ ඉඳලා එන ධනවත් සංචාරකයෝ හදාරන් කොට පත්වෙලා තියෙනවා ලංකාවට එන්න ඒ හේතුවෙන් ඉතින් ඒ වගේම අර රුසියාව කියලා රටවල් වලින් පැමිණෙන සංචාරකයෝ ගොඩක් වෙලාවට සම්බන්ධතා ඇති කරගෙන ඔවුන් එක එක හරහා සමහර වෙලාවට ලංකාවේ දැනට සංචාරක ව්‍යාපාරයේ නිරත වන ව්‍යාපාරිකයන්ටත් තමන්ගේ ව්‍යාපාරික අවස්ථා පවා අහිමි වෙලා තියෙනවා. ඉතින් එතකොට ඒ කියන්නේ මේකට ඒ ගැන රජයේ යම්කිසි මැදිහත් වීමක් සිදු නොකළහොත් ගොඩක් වෙලාවට ලංකාවේ සංචාරක ව්‍යාපාරය අඩපණ වෙන්න පුළුවන් සහ ගුණාත්මක සංචාරක ව්‍යාපාරය මෙතනින් ගොඩක් වෙලාවට අඩපණ වෙන්න පුළුවන්. ඉතින් ඒක ලංකාවට මොකද ලංකාව කියලා කියන්නේ ඉතාම ගොඩක් ඉහළ ධාරාවන්ද්‍ර සංචාරක ගමනාන්තයක්. එතකොට ලංකාව කියලා කියන්නේ විශාල රටක් නෙවෙයි ලංකාවට ම ු ලින් දහයක පහළවක සංචාරකයෝ එහෙම හැන්ඳ කරගන්න පුළුවන්කමකුත් නැහැ. ඉතින් ලංකාව කරාටකට මං හිතන්නේ වැඩිපුර වැදගත් වෙන්නේ ගුණාත්මක සංචාරක සේවයක් පවත්වාගෙන යන්න හැකි පසුබිම නිර්මාණය කිරීම යුරෝපයේ සිට සහ ධනවත් ප්‍රසංචාරකයන් ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සහ පහසුකම් සැලසීමට රජය මැදිහත් විය යුතුයි කියලා තමයි මම කල්පනා කරන්නේ ඊට අමතරව මම ඊළඟට කරුණක් විදියට කතා කරන්න කැමතියි ජාතික විදුලි පරිභෝජනය සම්බන්ධයෙන් එතකොට ලංකාවේ දැනට ජාතික විදුලි පරිභෝජනය වර්ධනයේ වේගය පවත්වාගත යුතු මට්ටමට වඩා අඩු වගේ එක තමයි පවත්වාගෙන යන්නේ දැනට වාර්තා වෙන අන්දමට ඒ කියන්නේ සීයට අටක පමණ වාර්ෂික ජාතික විදුලි පරිභෝජන වර්ධනයක් පවත්වා ගත යුතු වුණත් මේ වෙනකොට ඊට වඩා අඩු අගයක තමයි පවත්වාගෙන යන්නේ වාර්තා වෙන විදියට ඉතින් ඒකෙන් ඒක සංකේතවත් කරන්න එතකොට ජාතික ආර්ථිකය වර්ධනය වේගේ වර්ධනය වන වේගය අඩුයි කියන එක තමයි ඒක සංකේතවත් කරන්නේ. එතකොට ඒ හරහා ිෂ්පාදන ආර්ථිකය අනිවාර්යයෙන්ම වර්ධනය වෙන වේගය අඩුයි එතකොට ඒ හරහා සිද්ධ වෙන්න පුළුවන් දේ තමයි මිනිස්සුන්ගේ ජීවන මට්ටම අනිවාර්යෙන්ම වර්ධනය වෙන්නේ නෑ සහ ඒක තැන පල්වෙන තත්ත්වයකට

පත් වෙනවා. ඉතින් ඒකට ඒකට ගොඩක් නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීමට රජය මැදිහත් විය යුතුයි ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුයි. නමුත් අපිට පේන්නේ නැහැ ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් සාධනීය මැදිහත්වීමක් කරනවා. ඉතින් ඒ නිසා ඒ කියන්නේ ජාතික ආර්ථික ආර්ථිකය වර්ධනය කිරීමටත් ජන ජීවිතය ඉහල නංවීමටත් එම විදුලුයි පරිභෝජනය වරයෝජන සීමාව ඉහළ දමා ගැනීමට සහ විදුලි ඒකකයක මිල අවම කර ගැනීමට ආණ්ඩුව කටයුතු කළ යුතුයි. ඊට අමතරව මේ රජයේ විසින් බලයට පත්වෙන්න කලින් ප්‍රකාශ කරපු දෙයක් තමයි ඉන්න හිතෙන රටක් හදනවා කියන එක ඉතින් ඉන්න හිතෙන රටක් හදනවා කියලා කිව්වට පසුගිය වර්ෂය සහ ඊට කලින් වර්ෂ වල සංඛ්‍යා ලේඛන අනුව ගත්තාම ලංකාවේ ගිය වසරට මම හිතන්නේ ලක්ෂ තුනකට ආසන්න ප්‍රමාණයක් ඒ විදේශගත වන ප්‍රමාණය ගත්තොත් අපිට සංඛ්‍යාත්මකව ගත්තොත් එහෙම විදේශ විනිමය ඉපයීමේ ප්‍රමාණය වැඩිවෙලා තියෙන බවක් හඳුනාගන්න පුළුවන්.

මාධ්‍යවේදීන් ඇසූ ප්‍රශ්නවලට ලබාදුන් පිළිතුරු : තුෂාර වීරරත්න මහතා

මහා සංඝරත්නය පිළිබඳව ගත්තොත් මහා නායක ස්වාමීන් වහන්සේලාගේ සහ ඒ කාරක සංඝ සභාවල අවසරය අනුමැතිය සහිතව ඒ ක්‍රියාත්මක විය යුතු ක්‍රමවේදය තුළ තමයි එය සිදුවිය යුත්තේ මම හිතනවා ඒක දේශපාලනික කාරණයක් නොවිය යුතුයි. ඒ වගේම යම් විදිහකට භික්ෂු හැඳුනුම්පතක් හඳුන්වා දීම හරහා උත්සාහ කරනවා වෙන්න පුළුවන් යම් විදිහකට භික්ෂූන් වහන්සේලාවත් පාලනය කරන්නේ මොකද ගෞරවනීය මහා සංඝරත්නයට නිදහස තිබෙනවා ඕනෑම කාරණයක් පිළිබඳව විවෘතව අදහස් දක්වන්න සහ ඒ වෙනුවෙන් පෙනිහිටින්න. ඒක ආණ්ඩුවට පක්ෂද විරුද්ධද කියන කාරණයට වඩා බැලිය යුත්තේ උන්වහන්සේලා ඉදිරිපත් වෙලා මතු කරන තර්කයන් සහ ඉදිරිපත් කරන කරුණු කාරණා පිළිබඳව අවධානය යොමු කිරීම අපිට නිශ්චිතව මේ මොහොතේ කියන්න බෑ. භික්ෂු ඇඳුම්පත හඳුන්වා දීමේ ක්‍රමවේදය කුමක්ද කියලා රට හමුවේ හරියට පැහැදිලි කරලා නැති නිසා, හැබැයි අපේ ස්ථාවරය තමයි මහා සංඝරත්නය සම්බන්ධයෙන් යම් තීරණයක් බුද්ධ ශාසන අමාත්‍යාංශය ගන්නවා නම්, ඒ තීරණය විශේෂයෙන්ම සියලුම නිකායන් වල මහනායක ස්වාමීන් වහන්සේලා ඒ අනුමැතියන් සහිතව විධිමත් කතාබහකින් පස්සේ කතිකාවතකින් පස්සේ ඒ කටයුත්ත කළ යුතු වෙනවා. එහෙම නැතුව බලහත්කාරයෙන් මහා සංඝරත්නය මත භික්ෂු හැඳුනුම්පතක් සකස් කිරීම සම්බන්ධයෙන් භික්ෂු ඇඳුම්පත අනිවාර්ය කිරීමක් වගේ ක්‍රියාමාර්ගයක් ගැනීම මේ මොහොතේ කිසිසේත්ම සුදුසු නැහැ කියන එක අපේ ස්ථාවරය. මොකද මෙවැනි අනවශ්‍ය කාරණා මතු කිරීම හරහා විය හැකි දේ තමයි අනවශ්‍ය ආගමික ගැටුම්, අනාගමික අන්තවාදී තත්ත්වයන් මතුවීම. අපි දන්නවා ඉතිහාසයේ යම් යම් කාරණා සමාජගත කිරීම හරහා තමයි රැලි බවට පත්වෙලා විශාල සමාජ ව්‍යසනයක් ඇති වුණේ. ඉතින් ඒ නිසා භික්ෂූන් වහන්සේලා සම්බන්ධයෙන් ගැටළුවක් තියෙනවා නං ආණ්ඩුවට හැකියාව තිබෙනවා ඒ ඒ නිකායන්වල මහානායක ස්වාමීන් වහන්සේලා මුණගැහිලා උන්වහන්සේලත් එක්ක කාරක සංඝ සභාව එක්ක සාකච්ඡා කරලා ඒ සම්බන්ධයෙන් තීරණ ගැනීම.